1 වන ලියවිල්ල

## ශ්‍රී ලංකාවේ පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා වු නීතිමය රාමුවකි.

## කෙටි මාතෘකාව

1 ශ්‍රී ලංකාවේ පාරම්පරික දැනුම, එයට අදාල සහ අනුගත කරුණු ආරක්ෂා කිරීමට සහ කළමණාකරණය කිරීමට විධි විධාන සැපයීම සඳහා වු නීතියකි.

## ප්‍රතිපත්ති ප්‍රකාශය

2 ශ්‍රී ලංකා රජය

විද්‍යාත්මක, තාක්ෂණික, කර්මාන්ත, ආර්ථික, සංස්කෘතික, අධ්‍යාපනික, සමාජයිය සහ ආධ්‍යාත්මික යන සියලු ක්ෂේත්‍රයන්වල මිනිස් ප්‍රයත්නයන්හි පාරම්පරික දැනුමේ වැදගත්කම හා වටිනාකම

සහ

පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම, වර්ධනය කිරීම, සුරක්ෂිත කිරීම සහ සංරක්ෂණය කිරීම, ප්‍රවර්ධනය කිරිමේ,

පාරම්පරික දැනුම සතුවුවන්ගේ නීතිමය අවශ්‍යතා සහ අපේක්ෂාවන් සපුරා දීමේ,

දැනුම සහ සංවර්ධනය සඳහා පාරම්පරික දැනුම සතුවුවන්ගේ දායකත්වය වෙනුවෙන් සාම්ප්‍රදායික දැනුම සහ එය සතු වුවන්ගේ ගරුත්වය සහ පිළිගැනීම ආරක්ෂා කිරීමේ,

පාරම්පරික යෙදුමෙන් බැහැරව පාරම්පරික දැනුම භාවිතා කිරීම වෙනුවෙන් පාරම්පරික දැනුම සතුවුවන්ට සාධාරණ සහ සහේතුක ප්‍රතිලාභ ලැබෙන බවට සහතික වීමේ,

පාරම්පරික දැනුම භාවිතය, අනාවරණය, අත්පත් කර ගැනීම. සුරක්ෂිත කිරීම සහ සංරක්ෂණය, කළමනාකරණය, වර්ධනය සහ යොදා ගැනීම ක්‍රමානුකූල කිරීමේ,

පාරම්පරික දැනුම අනිසි ලෙස භාවිතය සහ අනිසි ලෙස යොදා ගැනීම සහ එයට අනවසරයෙන් ප්‍රවේශය අධෛර්යමත් කිරීමේ, පාලනය කිරීමේ, වැළැක්වීමේ සහ නැවැත්වීමේ,

ශ්‍රී ලංකාවේ පාරම්පරික දැනුමෙන් මිනිස් වර්ගයාට නිසි ප්‍රතිලාභ ලබා ගැනීමට ඉඩ ලබාදීමේ,

අවශ්‍යතාවය

හඳුනාගන්නා හෙයින් මෙම පනත පනවනු ලැබේ.

## අර්ථ නිරූපනය

3 පද සම්බන්ධය අනුව අන් අර්ථයක් නියම වේ නම් මිස

$ප්‍රවේශය යන්නෙන් විද්‍යාත්මක,වාණිජමය හෝ කාර්මික අරමුණු සඳහා පාරම්පරික දැනුම එකතු කිරීම, අත්පත් කර ගැනීම, අනාවරණය කිරීම, භුක්ති විඳීම හෝ භාවිතා කිරීම අදහස් වේ.

$ජීව විද්‍යාත්මක සම්පත් යන්නෙන් ජාන සම්පත්, ඒවායෙහි අවයව හෝ කොටස්, ගහණ හෝ මිනිස් වර්ගයාට ප්‍රයෝජනවත් හෝ වටිනාකමක් සහිත විය හැකි පරිසර පද්ධතිවල කවර හෝ වෙනත් සත්‍ය ජෛවමය අන්තර්ගත වර්ගයක් අදහස් වේ.

$ආයුර්වේද කොමසාරිස් යන්නෙන් 1961 අංක 31 දරණ ආයුර්වේද පනත යටතේ පත් කරන ලද ආයුර්වේද කොමසාරිස්වරයා අදහස් වේ.

$ අධිකරණය යන්නෙන්, නඩුවක විත්තිකාර පාර්ශ්වකරු හෝ පාර්ශ්වකරුවන් පදිංචිව සිටින්නේ හෝ නඩු නිමිත්ත උද්ගත වී ඇත්තේ හෝ බලාත්මක කරවා ගැනීමට ඉල්ලා සිටින ගිවිසුමට ඇතුලත් වන ලද්දේ හෝ යම් පළාතක් ඇතුළත ඒ පළාත් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබ ඇත්තා වූද, 1996 අංක 10 දරණ පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තියට අනුකූලව ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් සිවිල් අධිකරණ බලය පවරනු ලැබ ඇත්තා වූ ද මහාධිකරණ අදහස් වන අතර, යම් පළාතක් සඳහා එසේ මහාධිකරණයක් පිහිටුවනු ලැබ නොමැති හෝ එසේ සිවිල් අධිකරණ බලය පවරනු ලැබ නොමැති අවස්ථාවක, බස්නාහිර පළාත සඳහා පිහිටුවනු ලැබ ඇති මහාධිකරණය අදහස් වේ.

$ බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් යන්නෙන් 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනත යටතේ පත් කරන ලද බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

$ ව්‍යුත්පන්නයක් යන්නෙන් ජීවී හෝ අජීවී පැලෑටිවල අණුවක් හෝ එහි ස්වභාවික අණුවල එකතුවක් හෝ මිශ්‍රණයක් ද ඇතුළුව ජීවී හෝ අජීවී පැලෑටිවල ස්වභාවික හෝ සකස් කරන ලද සාරය අදහස් වේ.

$ ජාන සම්පත් යන්නෙන් සැබෑ හෝ සත්‍ය වටිනාකමක් තිබෙන පැලෑටියක, සත්ත්වයකුගේ, ක්ෂුද්‍ර ජීවියකුගේ හෝ වෙනත් යම් ආකාරයකින් ඇති වූ කවර හෝ ජාන ද්‍රව්‍යයක් අදහස් වේ.

$පාරම්පරික දැනුම දරන්නා යන්නෙන් මහජන සංජානනයේ නොවන්නාවූද,අදාල පුද්ගලයාට, පුද්ගල කණ්ඩායමට හෝ ජනකොටසට සුවිශේෂී වූද, පාරම්පරික දැනුම බුක්තියේ ඇත්තා වූ ශ්‍රී ලංකාවේ පුද්ගලයෙක්, පුද්ගල කණ්ඩායමක් හෝ ජන කොටසක් අදහස් වන අතර මහජන සංජානනයේ වන්නා වූ හා ශ්‍රී ලංකාවට සුවිශේෂ වූ පාරම්පරික දැනුම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය අදහස් වේ. නමුත් මෙම පනතේ ප්‍රතිපාදන උල්ලංඝනය වන ආකාරයට පාරම්පරික දැනුම ලබාගෙන ඇති පුද්ලයෙකු හෝ සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් ඊට ඇතුලත් නොවේ.

$ අවසර ගිවිසුම යන්නෙන් යම් පාරම්පරික දැනුමක් සතු වුවකු සහ තුන්වන පාර්ශවයක් අතර වූ එම සම්ප්‍රදායික දැනුම වෙත ප්‍රවේශය සහ ඊට අදාළ වන ගිවිසුමක් අදහස් වේ.

$ අමාත්‍යවරයා යන්නෙන් බුද්ධිමය දේපල විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

$ අනිසි ලෙස යොදා ගැනීම යන්නට (i) මෙම පනතේ විධිවිධාන කඩ කරමින් පාරම්පරික දැනුම අත්කර ගැනීම, යොදා ගැනීම හෝ භාවිතා කිරීම (ii) යම් පුද්ගලයකු තමා පාරම්පරික දැනුම අත්කර ගැනීම,යොදා ගැනීම හෝ භාවිතා කිරීම අසාධාරණ ආකාරයකින් සිදු කරන ලද බව දැන දැනම හෝ නොදැන සිටිය නොහැකි විට හෝ එසේ පාරම්පරික දැනුම ලබා ගත්තේ, යොදා ගත්තේ හෝ භාවිතා කරන ලද්දේ අසාධාරණ ආකාරයකින් බව දැන ගැනීමට නොසැලකිලිමත් වෙමින් පාරම්පරික දැනුම අත්පත් කර ගැනීම, (iii) පාරම්පරික දැනුමෙන් අසාධාරණ හෝ යුක්තිසහගත නොවන ප්‍රතිලාභ ජනිත වන ආකාරයේ, අවංක පරිචයන්ට විරුද්ධ වූ යම් වාණිජමය ක්‍රියාකාරකමක්, ඇතුලත් වේ.

$ පුද්ගලයා යන්නට ස්වභාවික පුද්ගලයෙකු හා යම් සංස්ථාගත හෝ සංස්ථාගත නොකල යම් පුද්ගල කණ්ඩායමක් ඇතුලත් වේ.

$ පැලෑටිය යන්නට පැලෑටියක කොටසක් හෝ එහි ව්‍යුත්පන්නයක් ද ඇතුලත් වේ.

$ පූර්ව දැනුම් දෙන ලද කැමැත්ත යන්නෙන් එකී පාරම්පරික දැනුමේ ආනුෂංගික භාවිතයද, එයට ප්‍රවේශය ලබා ගැනීමේදී අනුගමනය කළයුතු විශේෂ පියවරද , මුහුණ පෑමට සිදුවන අවදානම්ද එකී ප්‍රවේශය හේතුවෙන් ඇති වේ යයි සාධාරණ ලෙස කලින් දැන ගරු කළ හැකි යම් ගම්‍යතාවන්

ඇතුළුව තත් ප්‍රවේශය අවශ්‍ය කරන යම් හේතුවක් සඳහා එකී හේතුව පූර්ණ ලෙස හෙළිදරව් කිරීමෙන් පසු පාරම්පරික දැනුම වෙත ප්‍රවේශ වීමට ලබා දෙන ලිඛිත අවසරය අදහස් වේ.

$ මහජන සංජානනය යන්නෙන් යම් පාරම්පරික දැනුම දරන්නකු විසින් ලිඛිත හෝ අන් ආකාරයක ප්‍රකාශනයක් මගින් හෝ එකී දැනුම ප්‍රසිද්ධ කිරීමේ චේතනාවක් තිබූ බව හැඟ වෙන යම් ආකාරයකින් ඒ දැනුම භාවිතා කිරීමෙන් හෝ මහජනතාවට හෙළිදරව් කරන ලද දෙයක් වේ. එසේම මේ පනත ක්‍රියාත්මක වන දින වන විට ශ්‍රී ලංකාවට සුවිශේෂී වූ හා පොදුවේ ඇත්තා වූ පාරම්පරික දැනුමද එයින් අදහස් වේ.

$ ලේඛනය යන්නෙන් පනතේ 9 වන වගන්තිය යටතේ පිහිටුවන ලද පාරම්පරික දැනුම පිළිබඳ ලේඛනය අදහස් වේ.

$ පාරම්පරික දැනුම යන්නෙන් සාම්ප්‍රදායික පසුබිමක් තුළ බුද්ධිමය ක්‍රියාකාරීත්වයේ සහ ප්‍රතිවේදයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ දැනුමේ අන්තර්ගතය හෝ හරය අදහස් වන අතර එයට පාරම්පරික දැනුම් පද්ධතිවල කොටසක් වන ක්‍රම, හැකියාවන්, නව නිපැයුම්, පරිචයන් සහ ඉගෙනීම් ද යම් ප්‍රජාවක හෝ ජනතාවක සාම්ප්‍රදායික ජීවන රටාව තුළ ඇති දැනුම හෝ පරම්පරා අතර සම්ප්‍රේෂණය වන ලිඛිත හෝ සංග්‍රහගත කර ඇති දැනුම් පද්ධතිවල අන්තර් ගත වූ දැනුම ඇතුලත් වේ. ංපාරම්පරික දැනුමරැ යම් නිශ්චිත තාක්ෂණික ක්ෂේත්‍රයකට සීමා නොවන අතර ඊට ජාන සම්පත් හා අනෙකුත් ජෛව විවිධත්වයන් හි අන්තර්ගතයන් හා සබැඳි කෘෂිකාර්මික , පාරිසරික, සෞඛ්‍යාරක්ෂක හා ඖෂධීය දැනුම සහ පාරම්පරික ගෘහ නිර්මාණ හා ඉදිකිරීමේ තාක්ෂණයට අදාල ක්‍රියාකාරී ක්‍රම ඇතුලත්ය.

## පරිපාලනය

4 (1) බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙම පනතේ විධිවිධාන පරිපාලනය පිළිබඳ වගකිව යුතුය හෝ වගකීමදැරිය යුතුය. ඔහුට දේශීය වෛද්‍ය, කෘෂිකර්ම, ජෛව විවිධත්වය, පරිසරය, ශාක සහ සතුන්, වන ජීවීන් සහ වනාන්තර වැනි විෂයයන් අවධානය ට යොමු විය යුතු සහ අදාල විෂයයන් සමඟ කටයුතු කරන රාජ්‍ය ආයතනයන්හි සහාය අවශ්‍ය වන පරිදි සහ අවශ්‍ය වන අවස්ථාවන්හිදී ලැබිය යුතුය.

(2) බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍යනම් හා සුදුසු නම් උපදෙස් හා සහය ලබා ගැනීමට අමාත්‍යවරයා විසින් දේශීය වෛද්‍ය, කෘෂිකර්මය, ජෛව විවිධත්වය, පරිසරය, ශාක සහ සතුන් , වන ජීවීන් සහ වනාන්තරය යන විෂයයන් භාර අමාත්‍යවරුන් විමසා කමිටුවක් පත් කළ යුතුය. කමිටුව පුද්ගලයන් 10 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් යුක්ත විය යුතු අතර, ඔවුන් ඉහත සඳහන් රාජ්‍ය ආයතනවල පාරම්පරික දැනුම සහ අදාල විෂයයන් සම්බන්ධයෙන් සුවිශේෂ සහ ප්‍රකට දැනුමක් සහ පළපුරුද්දක් සහිත වුවන්ද, පාරම්පරික දැනුම සහ අදාල විෂයයන් පිළිබඳ ප්‍රකට සහ සුවිශේෂ දැනුමක් සහ පළපුරුද්දක් සහිත වෙනත් පුද්ගලයන්ද විය යුතුය. බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා කමිටුවේ ලේකම් බවට සහ නිල බලයෙන් සාමාජිකයෙකු බවට පත්විය යුතුය. සාමාජිකයන්ගෙන් එක් අයෙකු සභාපති වශයෙන් පත්කල යුතුය.

(3) අමාත්‍යවරයා විසින් තිරණය කරන පරිදි මෙම පනත කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහ පහසුකම් තිබිය යුතුය.

## පාරම්පරික දැනුම සඳහා අයිතිය

5 (1) මහජන සංජානනයෙහි ඇති පාරම්පරික දැනුම රැස් කිරීමට , භුක්ති විඳීමට, තබා ගැනීමට භාවිතා කිරීමට, වර්ධනය කිරීමට, කළමනාකරණය කිරීමට සහ ප්‍රයෝජන ගැනීමට ශ්‍රී ලාංකික ජනතාවට පරම සහ තනි අයිතිය තිබිය යුතුය. මෙම අයිතිය අන්සන්තක කළ නොහැක්කක් සහ අවසාන නොවන්නක් වන අතර, එය කවර හෝ කාල සීමාවකට සීමා නොවේ. ශ්‍රී ලංකා රජය බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා මගින් ශ්‍රී ලංකාවේ ජනතාව නියෝජනය කල යුතු අතර මෙම පනතේ කාර්යය සඳහා මහජන සංජානනයක් වන පාරම්පරික දැනුම දරන්නා වශයෙන් බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් වරයා සලකනු ලැබේ.

(2) ශ්‍රී ලංකාවේ මහජන සංජානනයෙහි නොමැති පාරම්පරික දැනුම දරන්නන්ට එම පාරම්පරික දැනුම මහජන සංජානනය යටතට ගැනෙන තාක්, එම දැනුම රැස් කිරීමට , භුක්ති විඳීමට, තබා ගැනීමට, භාවිතා කිරීමට, වර්ධනය කිරීමට කළමනාකරණය කිරීමට සහ ප්‍රයෝජන ගැනීමට පරම සහ තනි අයිතිය ඇත. මෙම අයිතිය අත්සතු කළ නොහැක්කක්ද අවසාන නොවන්නක්ද වේ.

(3) ශ්‍රී ලංකාවේ ජනතාවගේ සහ අනාගත පරපුරෙහි යහපත තකා මහජන සංජානනයෙහි වූ පාරම්පරික දැනුම සුරක්ෂිත කිරීම, වර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීමත් පාරම්පරික දැනුම හා අදාළ විද්‍යාත්මක පර්යේෂණ සහ නිර්මාණ දිරිමත් කර ප්‍රවර්ධනය කිරීමත් ශ්‍රී ලංකාවේ ජනතාව නියෝජනය කරන ශ්‍රී ලංකා රජයෙහි යුතුකම වේ. බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා දේශීය වෛද්‍ය, කෘෂිකර්මය, ජෛව විවිධත්වය, පරිසරය, සතුන් සහ ශාක, වන ජීවීන් සහ වනය වැනි සැලකිය යුතු සහ අදාල විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය ආයතන වල සහයෝගය එම සහයෝගය අවශ්‍ය වන පරිදි සහ අවශ්‍ය අවස්ථාවන්හි ලබා ගනිමින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මෙම යුතුකම ඉටු කිරීම සඳහා වගකිව යුතු විය යුතුය.

(4) (අ) ස්වකීය යහපත, අනාගත පරපුරේ යහපත සහ ශ්‍රී ලංකා ජනතාවගේ යහපත තකා එම දැනුම සුරක්ෂිත කිරීම, වර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ එම පාරම්පරික දැනුම සම්බන්ධව හා අදාලව විද්‍යාත්මක පර්යේෂණ සහ නව සංවර්ධනයන් ප්‍රවර්ධනය මහජන සංජානනයෙහි නොමැති පාරම්පරික දැනුම දරන්නන්ගේ යුතුකම වේ.

(ආ) මහජන සංජානනයෙහි නොමැති පාරම්පරික දැනුම දරන්නන්ගේ යහපත,අනාගත පරපුරේ යහපත සහ ශ්‍රී ලංකා ජනතාවගේ යහපත තකා එම දැනුම සුරක්ෂිත කිරීම, වර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීමට සහ එම පාරම්පරික දැනුම ඇතුලත් සහ අදාළ විද්‍යාත්මක පර්යේෂණ සහ නව සංවර්ධනයන් ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා රජය මහජන සංජානනයෙහි නොමැති පාරම්පරික දැනුම දරන්නන් දිරිමත් කර උපකාර කළ යුතුය. බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා දේශීය වෛද්‍ය, කෘෂිකර්මය, ජෛව විවිධත්වය, පරිසරය, සතුන් සහ ශාක, වන ජීවීන් සහ වනය වැනි සැලකිය යුතු සහ අදාළ විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය ආයතනවල සහයෝගය එම සහයෝගය අවශ්‍ය වන පරිදි සහ අවශ්‍ය අවස්ථාවන්හිදී ලබා ගනිමින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මෙම යුතුකම ඉටු කිරීම සඳහා වගකිව යුතු විය යුතුය.

6 මෙම පනතේ ප්‍රතිපාදනයන්ට යටත්ව පහත සඳහන් ක්‍රියාවලින් පාරම්පරික දැනුම ආරක්ෂා කළ යුතුය.

(1) පාරම්පරික දැනුම වෙත ප්‍රවේශය ;

(2) පාරම්පරික දැනුම අනිසි ලෙස යොදා ගැනීම;

(3) පාරම්පරික දැනුම වෙත නීතිමය ප්‍රවේශය ඇති යම් පුද්ගලයෙකු හෝ සංස්ථාගත කළ හෝ නොකළ යම් පුද්ගල කණ්ඩායමක් විසින් පාරම්පරික දැනුම අවසර රහිතව අනාවරණය කිරීම හෝ භාවිතා කිරීම;

(4) සොරකම් කිරීම, අල්ලස් දීම, නම්මවා ගැනීම, වංචා කිරීම, අනවසරයෙන් ඇතුල්වීම, ගිවිසුමක් කඩ කිරීම හෝ ගිවිසුමක් කඩ කිරීමට පෙළඹවීම, විශ්වාසය හෝ රහස්‍යභාවය කඩ කිරීම හෝ විශ්වාසය හෝ රහස්‍යභාවය කඩ කිරීමට පෙළඹවීම, භාරකාරත්ව යුතුකම් හෝ වෙනත් විශ්වාසී සබඳතා කඩ කිරීම, රැවටීම, වැරදි ලෙස නියෝජනය කිරීම, පාරම්පරික දැනුම වෙත ප්‍රවේශය ලබා ගැනීම සඳහා පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීමේදී නොමඟ යවන සුළු තොරතුරු සැපයීම හෝ වෙනත් අසාධාරණ හෝ වංක ක්‍රම මගින් පාරම්පරික දැනුම ලබා ගැනීම;

(5) පාරම්පරික දැනුම වෙත ප්‍රවේශය සම්බන්ධයෙන් පූර්ව දැනුම් දෙන ලද කොන්දේසියක් ලෙස අන්‍යෝන්‍ය ලෙස එකඟ වන ලද නියමයන් උල්ලංඝනය කරමින් පාරම්පරික දැනුම භාවිතා කිරීම.

(6) පාරම්පරික දැනුම හා ඊට අදාල විෂය කරුණු සම්බන්ධයෙන් බුද්ධිමය දේපල අයිතිවාසිකම් අත්පත් කර ගැනීම, ඒවාට හිමිකම් පෑම හෝ අයිතිවාසිකම් කියා පෑම හෝ එම බුද්ධිමය දේපල අයිතින් අදාල පාරම්පරික දැනුම සම්බන්ධව හෝ ඊට ප්‍රවේශය පිළිබඳ එකී කොන්දේසි වලට අනුව වලංගු නොවන ආකාරයට පාරම්පරික දැනුම පිළිබඳ අයිතියට හෝ පාලනයට අසත්‍ය ලෙස හිමිකම් පෑම හෝ අයිතිය කියාපෑම,

(7) යම් පාරම්පරික දැනුමක් පැහැදිලි ලෙසම අංග ඡේදනය, විකෘති කිරීම, විනාශකාරි ලෙස වෙනස් කිරීම හෝ නවීකරණය කිරීම හෝ පොදු සම්ප්‍රදායට සහ සදාචාරයට පටහැනි ලෙස භාවිතා කිරීම මගින් යම් තුන්වන පාර්ශවයක් විසින්, එම පාරම්පරික දැනුම දරන්නවුන්ට යම් සදාචාරත්මක හෝ අධ්‍යාත්මික වටිනාකමක් ඇති, පාරම්පරික දැනුමක් සාම්ප්‍රදායික යෙදුමෙන් බැහැරව සිතා මතාම සාවද්‍ය ලෙස භාවිතා කිරීම.

07 සාම්ප්‍රදායික තත්වයෙන් බැහැරව පාරම්පරික දැනුම භාවිතා කරන්නන් එම භාවිතාවේදී පාරම්පරික දැනුමේ ප්‍රභවය සහ එය දරන්නන් පිළිබඳව ප්‍රකාශිතව සඳහන් කළ යුතුය.

08 සාම්ප්‍රදායික යෙදුමෙන් බැහැරව පාරම්පරික දැනුම භාවිතා කරන්නන් සංස්කෘතික වටිනාකම් සහ එය දරන්නන්ගේ සම්ප්‍රදායන්ට ගරු කරන ආකාරයෙන් එය භාවිතා කළ යුතුය.

## පාරම්පරික දැනුම ලියාපදිංචි කිරීම

### පාරම්පරික දැනුම සහ අදාළ කරුණු පිළිබඳ ලේඛනය

09 (1) (අ) බුද්ධිමය දේපල අධ්‍යක්ෂවරයා විසින් පාරම්පරික දැනුම ලියාපදිංචි කිරීම සඳහා ලේඛනයක් පවත්වාගෙන තබාගත යුතුය.

(ආ) ලේඛනයේ 11 (1) වගන්තියේ සඳහන් සියළු තොරතුරු සහ වෙනත් නියමිත තොරතුරු ඇතුලත් විය යුතුය.

(2) ලේඛනයේ අරමුණ විය යුත්තේ

(අ) පාරම්පරික දැනුම රැස් කිරීම සහ සුරක්ෂිත කිරීම.

(ආ) පාරම්පරික දැනුම භාවිතය දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ඇ) පාරම්පරික දැනුම වෙත නීති විරෝධි ලෙස ප්‍රවේශවීම සහ පේටන්ට් ලබා ගැනීම වැළැක්වීම.

(ඈ) එම පාරම්පරික දැනුම වෙත ප්‍රවේශවීමෙන් ලැබෙන ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදී යන බවට සහතික වීම.

(3) පාරම්පරික දැනුම දරන කවර හෝ පුද්ගලයෙකු එම පාරම්පරික දැනුම ලේඛනයෙහි ලියාපදිංචි කළ හැකිය.

(4) පාරම්පරික දැනුම ලේඛනයෙහි ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවිය යුතු අතර, ස්වේච්ඡාමය විය යුතුය.

(5) පාරම්පරික දැනුම ලියාපදිංචි නොකිරීම මගින් මෙම පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ පොදු නීතිය හෝ සාධාරණත්වය හෝ සම්ප්‍රදාය යටතේ පාරම්පරික දැනුම දරණ පුද්ගලයාගේ අයිතින් වලට බලපෑමක් ඇති නොවිය යුතුය.

(6) පාරම්පරික දැනුම දරන පුද්ගලයකු ඔහු විසින් ලියාපදිංචි කරන ලද එම පාරම්පරික දැනුම දැරීම පිළිබඳ අයිතිය දැරිය යුතු අතර, එම පාරම්පරික දැනුම පිළිබඳ අයිතින් දිගටම භුක්ති විඳිය යුතුය.

(7) දේශිය වෛද්‍ය , කෘෂිකර්මය, ජෛව විවිධත්වය, පරිසරය, සතුන් සහ ශාක, වන ජීවීන් සහ වනාන්තර භාරව සිටින අමාත්‍යවරු විමසා එම පාරම්පරික දැනුම ප්‍රවර්ධනය කිරීමේ සහ ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණෙන් අමාත්‍යවරයාට නියෝග සම්පාදනය කළ හැකිය. යම් පාරම්පරික දැනුම දරන්නකු හමු වීම සඳහා අනුමත නියෝජිතයන් යැවීම පිළිබඳවද සහ දේශිය වෛද්‍ය, කෘෂිකර්මය, ජෛව විවිධත්වය, ශාක සහ සතුන්, වන ජීවීන් සහ වනය යන විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන වල කාර්ය භාර්ය පිළිබඳවද නියෝග ඊට ඇතුලත් විය යුතුය.

10 පාරම්පරික දැනුම ලියාපදිංචි කිරීම හා අදාල විධිවිධාන කවරක් වුවද මෙම පනත යටතේ පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම කවර හෝ විධිමත් අවශ්‍යතාවන් රහිතව සිදු කළ යුතුය.

## ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය

11 මහජන සංජානනයෙහි නොමැති පාරම්පරික දැනුම ලියාපදිංචි කිරීම සඳහා වු ඉල්ලුම්පත්‍රයක් නියමිත ආකෘති පත්‍රයක ඉදිරිපත් කළ යුතු අතර, එහි පහත සඳහන් දේ අඩංගු විය යුතුය.

(i) පාරම්පරික දැනුම දරන්නේ යැයි ප්‍රකාශිත පුද්ගලයාගේ අනන්‍යතාව

(ii) එකී පාරම්පරික දැනුම අදාළ වන පැලෑටිය හෝ පැලෑටි සාරයද (ව්‍යුත්පන්නය) ඇතුළුව විෂයයේ අනන්‍යතාව

(iii) පාරම්පරික දැනුම අනාවරණය කිරීම සහ පැලෑටියක් හෝ පැලෑටියක කොටසක් හෝ සාරයක් (ව්‍යුත්පන්නයක්) භාවිතා කිරීම වැනි ඒ අදාල විෂයයක්.

(iv) පැලෑටි වැනි අදාළ විෂය කරුණුවල භූ විද්‍යාත්මක පිහිටීම.

(v) සාම්ප්‍රදායික පරිචයන් පිළිබඳ තොරතුරු සහ පාරම්පරික දැනුම භාවිතා කිරීමේ හෝ ඊට ප්‍රවේශ වීමේදී ඇති සීමාවන් හෝ කොන්දේසි

(vi) පාරම්පරික දැනුම නිත්‍යානුකූලව දැරීම, ඉල්ලුම්කරු විසින් තහවුරු කිරීමට උපකාරී වන ලේඛන.

(vii) අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන කවර හෝ තොරතුරක්

(2) ඉල්ලුම්කරු යම් පුද්ගලයෙකු , පුද්ගල කණ්ඩායමක් හෝ ප්‍රජාවක් විය හැක්කේය. පාරම්පරික දැනුම දරන්නා යම් පුද්ගල කණ්ඩායමක් හෝ ප්‍රජාවක් වු විට එකී කණ්ඩායමේ හෝ ප්‍රජාවගේ බලයලත් තැනැත්තකු එකී කණ්ඩායම හෝ ප්‍රජාව වෙනුවෙන් පාරම්පරික දැනුම ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ යුත්තේය.

(3) පාරම්පරික දැනුම ලියාපදිංචි කරන ලද්දේ යම් පුද්ගලයෙකු, පුද්ගල කණ්ඩායමක් හෝ ප්‍රජාවක් නමින්ද එකී පුද්ගලයා, පුද්ගල කණ්ඩායම හෝ ප්‍රජාව එසේ ලියාපදිංචි කරන ලද පාරම්පරික දැනුම නිත්‍යානුකූලව දරන්නා ලෙස (ලියාපදිංචි පාරම්පරික දැනුම දරන්නා) එය එසේ නොවේ යැයි ඔප්පු කරන තෙක් සැලකිය යුත්තේය.

(4) එකම පාරම්පරික දැනුම ලියාපදිංචි කිරීම සඳහා එක් ඉල්ලුම්පත්‍රයකට වඩා වැඩි සංඛ්‍යාවක් ඇති අවස්ථාවක අදාල පාරම්පරික දැනුම සඳහා සමාන සැලකිල්ලක් සියලුම ඉල්ලුම්කරුවන්ට ලැබිය යුතුය. විවිධ පාරම්පරික දැනුම දරන්නන් විසින් හිමිකම් කියන පාරම්පරික දැනුම සංස්කෘතික, සාම්ප්‍රදායික හෝ වෙනත් ඓතිහාසික සම්බන්ධතා අනුව, නිත්‍යානුකූලව දරනු ලැබිය හැකිය. යන පිළිගැනීමට යටත්ව පාරම්පරික දැනුම ලියාපදිංචි කළ හැක.

12 ඉල්ලුම්පත්‍රය මෙහි ඉහත සඳහන් අවශ්‍යතාවන් සපුරා නොමැති විටකම බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආපසු යැවීමට හේතු ද සමග ඉල්ලුම්කරුට ඉල්ලුම්පත්‍රය ආපසු යැවිය යුත්තේය.

13 බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තමන් විසින්ම හෝ තත් කාර්යය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශ්වයක ඉල්ලීම මත පහත සඳහන් අවස්ථාවන්හිදී එනම්,

(1) (අ) ලියාපදිංචි කිරීම මෙම පනතේ කවර හෝ විධි විධානයක් උල්ලංඝනය කරමින් සිදුකර ඇත්නම් හෝ

(ආ) ලියාපදිංචි කිරීම සිදුකරන ලද්දේ ව්‍යාජ හෝ අසත්‍ය තොරතුරු මත නම් හෝ වංචා සහගත ලෙස නම්,

පාර්ශවකරුවන් ශ්‍රවණය කිරිමෙන් ඉක්බිතිව පාරම්පරික දැනුම සතු ලෙස ලියාපදිංචි පුද්ගලයාගේ නම අවලංගු කර නියම දරන්නාගේ නම ඇතුලත් කළ හැක.

(2) පාර්ශවයන් ශ්‍රවණය කිරිමෙන් අනතුරුව ලියාපදිංචි කිරීම ඉල්ලුම්කරු විසින් සපයා ඇති ව්‍යාජ හෝ අසත්‍ය තොරතුරු මත සිදුකර ඇති බව හෝ ඉල්ලුම්කරු වංචා සහගත ලෙස ක්‍රියාකර ඇති බව සොයා ගතහොත් බුද්ධිමය දේපල අධ්‍යක්ෂවරයාට තමන් විසින්ම හෝ තත් කාර්යය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයක ඉල්ලුම මත පාරම්පරික දැනුමේ ලියාපදිංචිය අවලංගු කළ හැක.

(3) බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාට තමා විසින්ම හෝ උනන්දුවක් දක්වන වෙනත් පාර්ශවයක ඉල්ලීම මත හෝ අදාළ පාර්ශවයන් විභාග කිරීමෙන් අනතුරුව, අමතර ලියාපදිංචි පාරම්පරික දැනුම දරන්නකු ඇතුලත් කිරීමට හෝ පාරම්පරික දැනුම ලියාපදිංචි කර ඇති පුද්ගල කණ්ඩායම හෝ ජන සමාජයේ අනන්‍යතාව සංශෝධනය වන පරිදි පාරම්පරික දැනුම ලියාපදිංචි කර ඇති ආකාරය සංශෝධනය කළ හැක.

14 බුද්ධිමය දේපල විෂයය භාරව සිටින අමාත්‍යවරයාට ඉහත සඳහන් අවලංගු කිරීම සම්බන්ධ කාර්ය පටිපාටිය පිළිබඳව සහ ඉහත සඳහන් සංශෝධන පිළිබඳ නියෝග සැදිය හැක.

## මහජන සංජානනයෙහි ඇති පාරම්පරික දැනුම සඳහා දත්තමුලය

15 (1) බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මහජන සංජානනයෙහි ඇති පාරම්පරික දැනුම අඩංගු දත්ත මුලයක් පිහිටුවා පවත්වාගෙන යා යුතුය. බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාට ස්වකීය රාජකාරි ඉටු කිරිමේදී ඒ සඳහා සාජු ප්‍රවේශය තිබිය යුතුය. ස්වකීය රාජකාරිය නීත්‍යනුකුලව ඉටු කරන කවර හෝ රාජ්‍ය නිලධාරියකුට බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ එකගතාව මත දත්ත මුලය වෙත ප්‍රවේශ විය හැකි විය යුතුය.

(2) ආයුර්වේද කොමසාරිස්වරයා සහ වෙනත් අදාල රාජ්‍ය ආයතන විසින් මෙම දත්ත මුලයෙහි ඇතුලත් කිරීම සඳහා එම දැනුම හඳුනාගෙන රුස්කර බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සම්ප්‍රේෂනය කළ යුතුය.

(3) දත්ත මුලයේ අන්තර්ගතය, පවත්වාගැනීම, කළමනාකරණය සහ ඒ හා අදාල වෙනත් සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සැදිය හැකිය.

(4) බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාට අමාත්‍යවරයා විසින් නියම කරන පරිදි පාරම්පරික දැනුම හා සම්බන්ධ ඩිජිටල් පුස්තකාල සහ වෙනත් වාර්තාද සැදිය හැකි වේ.

## පාරම්පරික දැනුම වෙත ප්‍රවේශය

16 යම් පාරම්පරික දැනුම දරන්නකුගේ පූර්ව ලිඛිත අවසරය සහිතව මිස කිසිම පුද්ගලයකු ලියාපදිංචි කර ඇති හෝ කර නොමැති මහජන සංජානනයෙහි තිබෙන්නා වු හෝ නොතිබෙන්නා වු පාරම්පරික දැනුමක් වෙත ප්‍රවේශය නොලැබිය යුතුය.

17 (1) කෙසේ වුවද බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියමිත ගාස්තුවට යටත්ව යම් පාරම්පරික දැනුම දරන්නෙකුගේ අනන්‍යතාවය සහ අදාල පාරම්පරික දැනුමේ ප්‍රතිලාභයන් යැයි දක්වා ඇති කරුණු තුන්වන පාර්ශවයන්ට ලබාදිය හැක.

(2) බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාට බුද්ධිමය දේපල පනත අනුව හෝ වෙනත් යම් නීතියක් යටතේ ස්වකීය රාජකාරි ඉටු කිරිමේදී පාරම්පරික දැනුම පිළිබඳ ලේඛනයට ප්‍රවේශය තිබිය යුතුය. බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ එකගතාව මත වෙනත් කවර හෝ රාජ්‍ය නිලධාරියකුටද කවර හෝ නීතියක් යටතේ ස්වකීය රාජකාරි ඉටු කිරිමේදී පාරම්පරික දැනුම පිළිබඳ ලේඛනයට ප්‍රවේශය තිබිය යුතුය.

18 (1) මහජන සංජානනයෙහි නොමැති පාරම්පරික දැනුමක් ලියාපදිංචිය දරන්නකු ලියාපදිංචිය සිදුකල දිනයේ සිට හෝ ඔහුගේ මරණය සිදු වු දිනයේ සිට යන දෙකෙන් පසුව පැමිණෙන දිනයේ සිට වර්ෂ **50** ක් තිස්සේ එම පාරම්පරික දැනුම පිළිබඳ අයිතිවාසිකම් දැරිය යුතුය. එම පාරම්පරික දැනුමට ලියාපදිංචිය දරන්නන් එක් අයකුට වඩා සිටියි නම් එම පාරම්පරික දැනුම දරන ජිවත්ව සිටින අවසන් ලියාපදිංචි වු පුද්ගලයාගේ මරණය තෙක් අයිතිවාසිකම් ක්‍රියාත්මක විය යුතුය.

(2) එම දිනයෙන් පසුව එකී පාරම්පරික දැනුම දරන්නා විය යුතු වන්නේ, ශ්‍රී ලංකා ජනතාව වෙනුවෙන් ශ්‍රී ලංකා රජය නියෝජනය කරන බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වයාටය.

(3) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා එකී කාල සීමාවට පෙර පුද්ගලයා මිය ගියහොත් ඔහුගේ නිත්‍යානුකූල උරුමකරුවන් එය දරන්නන් විය යුතුය.

19 යම් පාරම්පරික දැනුමක් දරන කවර හෝ පුද්ගලයෙකුගේ හෝ පාරම්පරික දැනුම වෙත ප්‍රවේශය අවශ්‍ය වන කවර හෝ 3 වන පාර්ශ්වයකගේ ඉල්ලීම මත එම පාරම්පරික දැනුම වෙත ප්‍රවේශවීම සඳහා බලපත්‍ර ගිවිසුමකට ඇතුලත් විමට බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පහසුකම් සලසා දිය යුතුය.

## යම් අවස්ථාවන්හිදි ප්‍රවේශය සඳහා ඉල්ලීම

20 (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවු පුද්ගලයකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි නොවු හෝ භාරකාරත්ව කළමනාකරණයේදී ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවුවන්ගේ සහභාගිත්වය ඇති සංස්ථාගත කළ හෝ නොකළ ආයතනයක් විසින් පාරම්පරික දැනුම වෙත ප්‍රවේශය සඳහා කරනු ලබන ඉල්ලීමක් ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ හෝ භාරකාරත්ව කළමනාකරණයේදී ශ්‍රී ලාංකික නොවන පුරවැසියන්ගේ සහභාගිත්වයක් නොමැති ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සංස්ථාගත හෝ කළ හෝ නොකළ ආයතනයක් හා ඒකාබද්ධව සිදුකළ යුතුය.

(2) එම ශ්‍රී ලාංකික පුරවැසියා හෝ සංස්ථාගත කළ හෝ නොකළ ආයතනය විසින් පාරම්පරික දැනුම වෙත ප්‍රවේශය සඳහා ඉල්ලුම්පත්‍රයක් නියමිත පරිදි බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

(3) මෙම වගන්තිය යටතේ පාරම්පරික දැනුම වෙත ප්‍රවේශවිම සම්බන්ධයෙන් බලපත්‍ර ගිවිසුමකට ඇතුල්වීමේ අරමුණෙන් සිදුකරනු ලබන සියලු සාකච්ඡාවලට බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා පාර්ශ්වකරුවකු විය යුතුය.

එම සාකච්ඡා සඳහා බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්වකීය හෝ ස්වකීය නියෝජිතයාගේ ප්‍රධානත්වයෙන් යුතුව මණ්ඩලයක් පත් කළ යුතු අතර එම මණ්ඩලයට

නිතිපතිවරයාගේ නියෝජිතයකු හා ආයුර්වේද කොමසාරිස්වරයාගේ නියෝජිතයෙකුද ඇතුළුව බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන වෙනත් කවර හෝ රාජ්‍ය ආයතනයක නියෝජිතයෙක්ද ඇතුලත් විය යුතුය.

(4) දැනුම දරණ පුද්ගලයා හෝ ඔහුගේ අනුයෝජිතයා සාකච්ඡා වලට සහ බලපත්‍ර ගිවිසුමට පාර්ශවකරුවකු විය යුතුය.

(5) බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් මහජන සංජානනයෙහි ඇති පාරම්පරික දැනුම සම්බන්ධයෙන් සාකච්ඡා කර බලපත්‍ර ගිවිසුමකට ඇතුලත් විය යුතු අතර (3) වන උප වගන්තියේ විධිවිධාන මෙම උප වගන්තියටද අදාළ විය යුතුය.

(6) මෙම වගන්තියේ 7 වන උප වගන්තිය යටතේ මෙම වගන්තිය යටතේ ඇති පාරම්පරික දැනුම ඇතුලත් වන කවර හෝ බලපත්‍ර ගිවිසුමකදී එම පාරම්පරික දැනුමෙන් හෝ එම පාරම්පරික දැනුමෙහි ප්‍රතිඵලයක් ලෙස සාදනු ලබන යම් නිෂ්පාදනයක් වෙළඳාම් කිරීමෙන් ලැබෙන විකුණුම් වලින් 0.5% ට නොඅඩු මුදලක් 26 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලට ගෙවිය යුතුය.

(7) මහජන සංජානනයෙහි ඇති කවර හෝ පාරම්පරික දැනුමක් ඇතුලත් බලපත්‍ර ගිවිසුමකදී එකගවනු ලබන මුදල පාරම්පරික දැනුම වෙත ප්‍රවේශය ලබා ගන්නා පුද්ගලයා විසින් 26 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති අරමුදලට ගෙවිය යුතුය.

## පූර්ව දැනුම් දෙන ලද කැමැත්ත

21 (1) යම් පාරම්පරික දැනුම දරන්නකුට එම පාරම්පරික දැනුම වෙත ප්‍රවේශවීම සඳහා වූ බලපත්‍ර ගිවිසුම් ඇති කිරීමටත් මෙම පනතේ විධි විධාන අනුව පූර්ව දැනුම් දෙන ලද කැමැත්ත ලබාදීමටත් හැකිය.

(2) මෙම පනතේ 20 වන වගන්තියට යටත්ව මහජන සංජානනයෙහි නොමැති යම් පාරම්පරික දැනුමක් දරන ලියාපදිංචි හෝ ලියාපදිංචි වී නොමැතිඅයකු එම පාරම්පරික දැනුම වෙත ප්‍රවේශ වීම සඳහා තුන්වන පාර්ශවයන් සමග අවසර ගිවිසුමකට ඇතුලත් වීම මේ පනතේ කිසිදු ප්‍රතිපාදනයකින් වළක්වනු නොලැබිය යුතුය.

(3) වෙනත් දේ අතර, පාරම්පරික දැනුම වාණිජමය සහ කාර්මික අරමුණු සඳහා භාවිතා කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ සාධාරණ සහ සමාන ලෙස බෙදා හදා ගැනීමට පාරම්පරික දැනුම දරන්නවුන්ට හිමිකම ඇත.

(4) වෙනත් දේ අතර, පාරම්පරික දැනුම වාණිජමය හෝ කාර්මික නොවූ අරමුණු සඳහා භාවිතා කිරීමෙන් ඇතිවන පර්යේෂණ ප්‍රතිඵල සහ අධ්‍යාපනික ක්‍රියාකාරකම් වල නිරතවීම වැනි මූල්‍යමය නොවන ප්‍රතිලාභ සඳහා පාරම්පරික දැනුම දරන්නෝ හිමිකම් ලබති. වාණිජමය හෝ කාර්මික නොවන අරමුණු සඳහා කවර හෝ තුන්වන පාර්ශවයක් සමග පාරම්පරික දැනුම වෙත ප්‍රවේශය සඳහා ඇතිකර ගත් ගිවිසුමක් යටතේ කවර හෝ මූල්‍යමය හෝ ඒ හා සමාන ප්‍රතිලාභයක් පාරම්පරික දැනුම දරන්නන් විසින් භුක්ති විඳීමේ අයිතිය මෙම පනතේ විධි විධාන මගින් ප්‍රතික්ෂේප කරනු නොලැබේ.

## අවසර ගිවිසුම

22 අවසර ගිවිසුමෙහි වෙනත් දේ අතර පහත සඳහන් දෑ අඩංගු විය යුතුය.

(1) අවසර ගිවිසුමේ පාර්ශවයන්ගේ නම, ලිපිනය සහ නියමකරනු ලැබූ වෙනත් තොරතුරු

(2) අවසර ගිවිසුම අදාල වන පාරම්පරික දැනුම පිළිබඳ විස්තරයක්

(3) පාරම්පරික දැනුම දරන පුද්ගලයාට ඇතිවන ප්‍රතිලාභ

(4) අදාල වේ නම්, අරමුදලට ගෙවන මුදල

(5) අදාල වේ නම් පාරම්පරික දැනුම භාවිතය හා සම්බන්ධ සීමාවන්

(6) ප්‍රවේශය අවශ්‍ය වන ක්‍රියාකාරකමේදී ගනු ලබන පියවරවල තත්ත්වය පිළිබඳ පාරම්පරික දැනුම සතු පුද්ගලයාට දැනුම් දීමට, පාරම්පරික දැනුම වෙත ප්‍රවේශය ලබාගන්නා පාර්ශ්වයන් සතු බැදීම.

23 (1) සෑම අවසර ගිවිසුමක්ම ලිඛිත විය යුතු අතර,ගිවිසුමට බැදෙන පාර්ශ්වයන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් අත්සන් තබා තිබිය යුතුය. එම සෑම අවසර ගිවිසුමක්ම නියම කරනු ලබන පරිදි බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ ලියාපදිංචි කළ යුතුය.

(2) ලියාපදිංචි නොකළ අවසර ගිවිසුම් වලට කවර හෝ නීතිමය බලයක් නැත.

(3) (අ) නීතිය යටතේ වූ ස්වකීය රාජකාරිය ඉටු කිරීමේදී බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාට එම ලේඛනයට සෘජු ප්‍රවේශය තිබිය යුතුය.

(ආ) කවර හෝ නීතියක් යටතේ ස්වකීය රාජකාරිය ඉටු කරන ආයුර්වේද කොමසාරිස්වරයාට හෝ වෙනත් යම් රාජ්‍ය නිලධාරියෙකුට බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ එකඟත්වය මත ලේඛනය වෙත ප්‍රවේශ විය හැක.

(4) (අ) ලියාපදිංචි කිරීම මෙම පනතේ විධිවිධානයක් කඩ කරමින් සිදුකර ඇත්නම් හෝ

(ආ) ලියාපදිංචි කිරීම අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරු මත පදනම්ව හෝ වංචා සහගතව සිදුකර ඇත්නම් හෝ බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාට තමා විසින්ම හෝ උනන්දුවන යම් පාර්ශ්වයක ඉල්ලීම මත එම පාර්ශවයන් විභාග කිරීම අවශ්‍ය බව ඔහු විසින් සලකයි නම් එසේ විභාග කිරීමෙන් අනතුරුව කවර හෝ අවසර ගිවිසුමක ලියාපදිංචිය අවලංගු කළ හැක.

(ඇ) ඉහත සඳහන් අවලංගු කිරීම හා සම්බන්ධ ක්‍රියාපටිපාටිය හා අදාළ නියෝග පැනවීමට අමාත්‍යවරයා හට හැක.

24 අවසර ගිවිසුමේ පාර්ශ්වයන්ගේ ලිඛිත අවසරය සහිතව මිස එම අවසර ගිවිසුමට පාර්ශ්වයක් නොවූ යම් තුන්වන පාර්ශ්වයක් විසින් එම ලේඛනය වෙත ප්‍රවේශය ලබා නොගත යුතුය. එසේ අවසරලත් තුන්වන පාර්ශ්වයන්ට නියමිත පරිදි සහ නියමිත ගාස්තුවට යටත්ව බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙතින් එහි සඳහන් තොරතුරු ලබාගත හැක.

25 (1) පාරම්පරික දැනුම දරන්නන් එක් අයකු හෝ වැඩි ගණනක් සමඟ අවසර ගිවිසුමක් ඇතිකර ගැනීම මගින් එම පාරම්පරික දැනුමම දරන්නා වූ වෙනත් අය එම පාරම්පරික දැනුම සම්බන්ධයෙන්ම අවසර ගිවිසුමක් ඇති කර ගැනීම වළක්වනු නොලැබිය යුතුය.

(2) එම කවර හෝ අවසර ගිවිසුමක් මගින් පාරම්පරික දැනුම දරන වර්තමාන සහ අනාගත පරපුරෙහි එම පාරම්පරික දැනුම භාවිතා කිරීමේත්, වර්ධනය කිරීමේත් අයිතියට බලපෑම් ඇති නොවිය යුතුය.

## පාරම්පරික දැනුම පිළිබඳ අරමුදල

26 $පාරම්පරික දැනුම පිළිබඳ අරමුදල නමින් මෙම පනත යටතේ පිහිටුවා පවත්වාගෙන යනු ලබන අරමුදලක් තිබිය යුතුය. එම අරමුදලට පහත සඳහන් මුදල් බැරකළ යුතුය.

(1) පාර්ලිමේන්තුව මගින් කලින් කලට අරමුදල සඳහා වෙන් කරනු ලබන සියළු මුදල්

(2) මෙම පනත අනුව ඇතිකර ගන්නා ලද අවසර ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන සියළු මුදල්

(3) මෙම පනත යටතේ කතා භාග වශයෙන් ලැබෙන සියළු මුදල්

(4) මෙම පනත යටතේ ගාස්තු වශයෙන් ලැබෙන සියළු මුදල්

(5) මෙම පනත යටතේ අධිකරණය මගින් දඩ හෝ අලාභ වශයෙන් ලබාදෙන සියළු මුදල්

(6) ශ්‍රී ලංකාව හෝ ශ්‍රී ලංකාවට පිටතින් අරමුදලට ණය, ප්‍රදාන , ත්‍යාග හෝ දාන වශයෙන් කවර හෝ ප්‍රභවයකින් ලැබෙන මුදල්

27 පාරම්පරික දැනුම ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ සුරක්ෂිත කිරීම සඳහාත් මෙම පනත ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය කිරීම සඳහාත් අරමුදල භාවිතා කළ යුතුය.

28 බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනත හා සම්බන්ධ ආදායම සහ වියදම, වත්කම් සහ වගකීම් සහ අනෙකුත් සියළු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් පවත්වා ගැනීමට කටයුතු යෙදිය යුතුය.

29 ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය අනුව විගණකාධිපතිවරයා විසින් සෑම වර්ෂයකම අරමුදලෙහි ගිණුම් විගණනය කළ යුතුය.

30 අරමුදල හා සම්බන්ධ ගිණුම් පොත් පොදු ලේඛනයක් විය යුතු අතර, මහජන පරීක්ෂාව සඳහා විවෘත විය යුතුය.

31 අරමුදල පරිපාලනය හා සම්බන්ධ නියෝග අමාත්‍යවරයාට සෑදිය හැක.

## අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණවලට එරෙහි අභියාචන

32 (1) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කවර හෝ තීරණයක් මගින් අසංතෘප්තියට පත් කවර හෝ පුද්ගලයෙකුට, එම තීරණය ලබාදී සය මසක කාල සීමාවක් තුළ අධිකරණයට අභියාචනයක් කළ හැක.

(2) එවැනි පුද්ගලයකුට අභියාචනය කරනු ලබන තීරණයේ සහතික පිටපතක් සහ බුද්ධිමය දේපල කාර්යාලයේ තබා ඇති අදාල සියළු ලේඛන වල පිටපත්ද සමඟ අභියාචන පෙත්සමක ආකාරයෙන් අධිකරණයට අභියාචනයක් කළ හැක. අභියාචන පෙත්සමේ පිටපත් සහ අනෙකුත් ලේඛන බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් වෙතටත් අභියාචන පෙත්සමේ නම් සඳහන් වෙනත් වග උත්තරකරුවන් වෙතත් භාර දිය යුතුය. එසේ භාරදුන් බවට සාක්ෂි පෙත්සම සමගම අධිකරණයට ඉදිරිපත් කළ යුතුය. විරෝධතා ප්‍රකාශයක් ගොනු කිරීමට වග උත්තරකරුවන්ට හිමිකම ඇත.

(3) බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ගොනුවේ මුල් පිටපත ඉල්ලා සිටීමට අධිකරණයට හැක. තවද ආරවුලට සම්බන්ධ කාරණය සම්බන්ධයෙන් බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරිපිට දැනටමත් දී ඇති සාක්ෂි වලට අමතරව සහ ඒවාට අතිරේක වශයෙන් දිවුරුම් ප්‍රකාශ සහ ලේඛන මාර්ගයෙන් නව සාක්ෂි ලබාගෙන භාර ගැනීමටද අධිකරණයට හැක.

(4) එම කවර හෝ අභියාචනයකදී බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අනුමත කිරීමට, ප්‍රතිවිරුද්ධ තීරණයක් දීමට හෝ වෙනස් කිරීමටත්, අධිකරණයට අවශ්‍ය වේ නම් වැඩිදුර විභාගයක් කරන මෙන් බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් දීමටත් අධිකරණයට හැක.

## බලාත්මක කිරීම

### සිවිල් ප්‍රතිකර්ම

33 පාරම්පරික දැනුම දරන්නකු අධිකරණය සෑහිමකට පත් වන පරිදි යම් පුද්ගයකු මෙම පනතේ 6 වන වගන්තියේ විධි විධාන යටතේ සඳහන් කර ඇති කවර හෝ ක්‍රියාවක් කිරීමට සූදානම් වන බව හෝ කරන බවට තර්ජනය කරන බව හෝ එවැනි ක්‍රියාවක් සිදුකර ඇති බව හෝ ඔප්පු කරයි නම් හෝ එම උල්ලංඝනය කිරීම හෝ එම ක්‍රියා සිදු කිරීමෙන් හෝ දිගටම සිදු කිරීමෙන් එවැනි කවර හෝ පුද්ගලයෙකු වළක්වන ඉන්ජන්ෂන් තහනමක් ප්‍රදානය කිරීමටත් අලාභ සහ අධිකරණය විසින් සුදුසු සහ සාධාරණ යැයි සළකන වෙනත් සහන ලබාදෙන ලෙස නියෝග කිරීමටත් අධිකරණයට හැක. ඉන්ජන්ෂන් තහනමද අලාභ ප්‍රදානය සමගම ප්‍රදානය කළ හැකි වන අතර, ඉල්ලුම්කරුට අලාභ සඳහා හිමිකම් තිබ්මේ හේතුව මත පමණක් එය ප්‍රතික්ෂේප නොකළ යුතුය.

34 (i) යම් ලාභයක් අයකර ගැනීමට අමතරව එසේ උල්ලංඝනය කිරීමේ හේතුව මත, ඔහු විසින් විඳින ලද අලාභයට වන්දි ගෙවීමට ප්‍රමාණවත් පරිදි නියම අයිතීන් දරන්නාට එම අලාභ ගෙවන ලෙසත්,

(ii) හිමිකම්පෑම තහවුරු කිරීම සඳහා පාරම්පරික දැනුම දරන්නකු විසින් සාධාරණව ලබාගත හැකි සාක්ෂි ඉදිරිපත් කර ඇත්තා වුද ඒ හිමිකම්පෑම තහවුරු කිරීම සඳහා වු සාක්ෂි යම් පුද්ගලයකුගේ පාලනයෙහි පවත්නා බව පාරම්පරික දැනුම දරන්නා විසින් නිශ්චිතව සඳහන් කරන අවස්ථාවක ඒ හිමිකම්පෑම තහවුරු කිරීම සඳහා අදාළ හා එම පුද්ගලයාගේ පාලනයේ පවත්නා සාක්ෂි රහස්‍ය තොරතුරු ආරක්ෂා කරනු ලැබීමට යටත්ව ඉදිරිපත් කරන ලෙසත්, එම පුද්ගලයාට නියෝග කිරීමට, අධිකරණයට බලය තිබිය යුතුය.

35 උල්ලංඝනය කිරීමේ තත්වය බරපතලභාවයට සමානුපාතික නොවන අවස්ථාවක දී හැර එම පාරම්පරික දැනුම යොදන භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය කිරීමෙහි සහ බෙදා හැරීමෙහි යෙදෙන පුද්ගලයන්ගේ අනන්‍යතාව සහ ඔවුන් විසින් භාවිතා කරනු ලබන සියළු බෙදා හැරීමේ මාර්ග පිළිබඳ පාරම්පරික දැනුම දරන පුද්ගලයාට දැනුම් දෙන ලෙස එම අනෙක් පුද්ගලයාට නියම කිරීමට අධිකරණයට හැක.

36 සුදුසු අවස්ථාවන්හිදී, විශේෂයෙන්ම යම් ප්‍රමාදයක් හේතුවෙන් පාරම්පරික දැනුම දරන පුද්ගලයාට ප්‍රතිකර්ම යෙදිය නොහැකි අලාභ සිදුවිය හැකි නම් හෝ සාක්ෂි විනාශ වීමේ පැහැදිලි අවදානමක් පවතියි නම් හෝ ආරක්ෂාව හා අදාළ ඒක පාර්ශ්වික අතුරු පියවර නියෝග කිරීමේ බලය අධිකරණය සතුවිය යුතුය.

37 අතුරු පියවර ඒක පාර්ශ්විකව නියෝග කරන ලද අවස්ථාවකදී බලපෑමට ලක්වූ පාර්ශ්වයන්ට ඒ පිළිබඳව දැනුම් දිය යුතුය. එම දැනුම්දීම ලද පසුව, නියෝග කරන ලද අතුරු පියවර වෙනස් කළ යුතුද හෝ ඉවත් කළ යුතුද යන්න පිළිබඳව විභාග කරනු ලැබීමටද එම පාර්ශ්වයන්ට අයිතිය තිබිය යුතුය.

38 අලාභ ප්‍රදානය හා අදාළව පනතේ විධි විධාන කවරක් වුවද, කවර හෝ පාරම්පරික දැනුම දරන්නකුට අලාභ අයකර ගැනීම සඳහා අවසන් තීන්දුව දීමට පෙර කවර හෝ අවස්ථාවක ඔප්පු කරන ලද සත්‍ය අලාභ වෙනුවට අධිකරණය විසින් සුදුසු හා සාධාරණ යැයි හැගෙන පරිදි රුපියල් පනස්දහසකට නොඅඩු සහ රුපියල් මිලියනයකට නොවැඩි ව්‍යවස්ථාපිත අලාභ ප්‍රදානයක් තෝරා ගැනීමට හැක.

39 උනන්දුවක් දක්වන යම් පාර්ශවයක් විසින් කරන ඉල්ලීම මත, බුද්ධිමය දේපල පනතේ 160 වන වගන්තිය යටතේ, පාරම්පරික දැනුම හා අදාළ අසාධාරණ තරගකාරීත්ව ක්‍රියාවක් සිදු කිරීම හෝ කරගෙන යාමෙන් හෝ යම් පුද්ගලයකු වැළැක්වීමේ බලය අධිකරණයට තිබිය යුතුය.

40 පාර්ශ්වයක් වු කවර හෝ පුද්ගලයකු මෙම පනත යටතේ දෙන ලද අධිකරණ නියෝගයකින් හෝ තීන්දුවකින් අතෘප්තිමත් වේ නම් ඔහුට 1996 අංක 10 දරණ පළාත්බද මහාධිකරණ පනතේ (විශේෂ විධි විධාන) 5 වන සහ 6 වන වගන්තිය යටතේ යම් නෛතික හෝ සිද්ධිමය දෝෂයක් නිවැරදි කරන ලෙස ඉල්ලා සිටිමින් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැක.

41 මෙම පනත යටතේ අධිකරණය ඉදිරියේ වූ කවර හෝ නඩු කටයුත්තකදී ගාස්තු ගෙවන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියෝග නොකළ යුතුය. කෙසේ වුවද අධිකරණයේ අභිමතය පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ගාස්තු ගෙවන ලෙස නියෝග කළ හැක.

**අපරාධ වගකීම**

42 (i) මෙම පනතේ 6 වන වගන්තියෙහි විධිවිධාන යටතේ පිළිගෙන ඇති කවර හෝ අයිතිවාසිකම් චේතාන්විතව උල්ලංඝනය කරන හෝ උල්ලංඝනය කිරීමට උත්සාහ කරන කවර හෝ පුද්ගලයකු වැරදිකරුවකු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වැරදිකරු බවට තීන්දු කළ පසු රු.5000,000/- ට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

(ii) (1) වන ඡේදයේ සඳහන් කවර හෝ වරදක් කිරීමට චේතාන්විතව අනුබල දෙන කවර හෝ පුද්ගලයකු වැරදිකරුවකු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වැරදිකරු බවට තීන්දු කළ පසු රු. 5,000,000/- ට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

43 (1) (අ) මෙම පනත යටතේ වරදක් සිදුකල බවට තොරතුරු ලැබීමෙන් පසු මහේස්ත්‍රාත්වරයා විසින් එම වරද සිදු කරන ලදැයි පැවසෙන පුද්ගලයාට අධිකරණය ඉදිරියේ පෙනී සිට හේතු දක්වන ලෙසට නියම කරමින් සිතාසි නිකුත් කළ හැකිය. එම පුද්ගලයා අධිකරණය ඉදිරියේ පෙනී සිටිම පැහැර හරියි නම් එම පුද්ගලයා අත් අඩංගුවට ගැනීමට මහේස්ත්‍රාත්වරයා විසින් වරෙන්තු නිකුත් කළ හැකිය.

(ආ) ඒ වරද කිරීමට උපයෝගී කරගනු ලැබූ භාණ්ඩ හෝ දේ හෝ ඒ වරද කරනු ලැබුවේ යම් භාණ්ඩ හෝ දේ සම්බන්ධයෙන්ද, ඒ භාණ්ඩ හෝ දේ ඒ තොරතුරු අනුව චෝදනා නගනු ලැබූ තැනැත්තාට යම් නිවසක හෝ පරිශ්‍රයක තිබෙන බව නැතහොත් යම් තැනක ඔහුගේ සන්තකයේ හෝ ඔහුගේ පාලනයට යටත්ව තිබෙන බව සැක කිරීමට සාධාරණ හේතුවක් තිබෙන බවට දිවුරුම් පිට සපයන ලද තොරතුරකින් එකී මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක ඒ මහේස්ත්‍රාත්වරයා විසින් තම අත්සනින් යුතුව වරෙන්තුවක් නිකුත් කළ හැකිය.

(ඇ) දවසේ සාධාරණ කාලයකදී එම නිවස, පරිශ්‍රය හෝ ස්ථානයට ඇතුල් වී එම භාණ්ඩ හෝ ද්‍රව්‍ය පරීක්ෂා කර අල්ලා ගැනීමට නීතිය අනුව කවර හෝ පොලිස් නිලධාරියකුට හෝ වරෙන්තුවේ නම් කර ඇති හෝ සඳහන් කර ඇති වෙනත් පුද්ගලයකුට හැක. එම කවර හෝ වරෙන්තුවක් යටතේ අල්ලා ගන්නා ලද භාණ්ඩ හෝ ද්‍රව්‍ය මෙම පනත යටතේ රාජසන්තක කළ හැකිදැයි යන්න තිරණය කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියට ගෙනා යුතුය.

(2) (අ) භාණ්ඩ හෝ කිසිවක හිමියා වරදකරු කරනු ලැබූ විටක, මේ පනත යටතේ රාජ්‍ය සන්තක කිරීමට යටත්වන ඒ භාණ්ඩවල හෝ දේවල හිමියා කවරකුදැයි දැන නොසිටී නම් හෝ ඔහු සොයා ගත නොහැකි නම් හුදෙක් ඒ රාජ්‍ය සන්තක කිරිම ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා තොරතුරු සැපයිය හැකිය. නැතහොත් පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය. ඒ භාණ්ඩ හෝ දේවල රාජ්‍ය සන්තක නොකිරීමට, දැන්වීමෙහි සඳහන් වේලාවේදී සහ ස්ථානයේදී හේතු දක්වන ලෙස නියම කරමින් මහේස්ත්‍රාත්වරයා විසින් දැන්වීමක් පළ කිරීමට සැලැස්විය හැක.

(ආ) අයිතිකරු හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින යම් පුද්ගලයකු හෝ භාණ්ඩ හෝ ද්‍රව්‍ය පිළිබඳ උනන්දු වන වෙනත් පුද්ගලයකු, දැන්වීමේ නම්කර ඇති ස්ථානයේදී එයට විරුද්ධව ප්‍රමාණවත් ලෙස හේතු දැක්වීමට අසමත් වුවහොත් එම භාණ්ඩ හෝ ද්‍රව්‍ය රාජසන්තක කරන ලෙස මහේස්ත්‍රාත්වරයාට නියම කළ හැක. එම සෑම නියෝගයක්ම අභියාචනයකට යටත් විය යුතුය.

(3) මෙම පනත යටතේ රාජසන්තක කරනු ලබන කවර හෝ භාණ්ඩ හෝ ද්‍රව්‍ය, එය රාජසන්තක කරන ලෙස නියෝග කළ මහේස්ත්‍රාත්වරයාගේ උපදෙස් පරිදි විනාශ කිරීම හෝ බැහැර කිරීම කළ යුතුය. මහේස්ත්‍රාත්වරයාට එම භාණ්ඩ බැහැර කිරීමෙන් ලැබෙන යම් ලාභයක් වේ නම් එය එම භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කිරිමෙන් අලාභ සිදුවූ යම් අහිංසක පාර්ශ්වයකට ප්‍රදානය කළ හැක.

44 මෙම පනත යටතේ වූ සියළු වැරදි 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන පනතේ අර්ථානු කූලව සංජෙද්‍ය සහ ඇප දිය හැකි විය යුතුය. මෙම පනත යටතේ සිදු කරනු ලබන කවර හෝ වරදක් සඳහා අපරාධ නඩු විධාන පනත් සංග්‍රහයේ විධිවිධාන අදාල විය යුතුය.

45 මෙම පනත යටතේ වූ වරදක් සඳහා, චෝදනා කරනු ලබන වරද සිදුකර වර්ෂ තුනක් ඉකුත් වීමෙන් පසුව හෝ පැමිණිල්ල කරන්නා විසින් ඒ පිළිබඳ සොයා ගැනීමෙන් වර්ෂ දෙකක් ඉකුත් වීමෙන් පසුව යන දෙකෙන් පළමුව ඉකුත් වූ දිනෙන් පසු පැමිණිලි නොකළ යුතුය.

**සංස්ථා විසින් කරනු ලබන වැරදි**

46 මේ පනත යටතේ වරදක් සංස්ථාවක් විසින් කර ඇති අවස්ථාවක වරද කරුණු ලැබූ වේලාවේදී සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ එම සංස්ථාවේ වෙනත් සමාන නිලධාරියෙකු හෝ එම ධුරයේ ක්‍රියා කළ යුතු වූ සෑම පුද්ගලයකුම එම ධුරයේ ස්වකීය කර්තව්‍ය ගන්නා ස්වභාවය අනුව සහ සියළු අවස්ථාගත කරුණු අනුව, ඒ වරද තමාගේ කැමැත්ත හෝ අපසහායකත්වය නොමැතිව සිදු කර ඇති බව සහ ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තමා විසින් කළ යුතුව තිබූ ක්‍රියා නිසි අනලස්භාවයෙන් කළ බව ඔප්පු කළහොත් හැර ඒ වරද කළ බව සලකනු ලැබිය යුත්තේය.

**අපසහායකයන්ට දඬුවම් කිරීම**

47 ශ්‍රී ලංකාව ඇතුළත දී කරනු ලැබුවහොත් මේ පනත යටතේ වරදක් වන යම් ක්‍රියාවක් ශ්‍රී ලංකාවෙන් පිටත දී කිරීමට ශ්‍රී ලංකාව තුළ සිට අනුබල දෙන යම් තැනැත්තකු ඒ වරද කළ ලෙස සලකනු ලැබිය යුතු අතර ශ්‍රී ලංකාව තුළ ඔහු වෙසෙන කවර හෝ දිස්ත්‍රික්කයක දී හෝ ස්ථානයක දී ඒ වරද කරනු ලැබූ විටක මෙන් ඒ දිස්ත්‍රික්කයේ දී හෝ ස්ථානයේදී ඔහුට විරුද්ධව අධිචෝදනා කිරීමට, නඩු පැවරීමට, නඩු විභාගයක් පැවැත්වීමට හා වරදකරු කිරීමට ඔහු යටත් විය යුතුය.

## ඉතිරි කිරීම්

48 (1) මෙම පනතේ විධිවිධාන නිසා නොවේ නම්, යම් තැනැත්තකුට විරුද්ධව ඉදිරිපත් කළ හැකි වන යම් නඩුවකින්, සිවිල් නඩුවකින් හෝ වෙනත් නඩු කටයුත්තකින්, ඒ තැනැත්තා මේ කොටසේ විධිවිධාන නිසා නිදහස් නොවිය යුතුය.

(2) යම් නඩුවක දී සම්පූර්ණ අනාවරණයක් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ යම් ප්‍රශ්නයකට හෝ ප්‍රශ්නාවලියකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීමට මේ පනතේ අන්තර්ගත කිසිවකින් කිසි තැනැත්තකුට හිමිකම නොලැබෙන නමුත්, මේ පනත යටතේ වෙනත් යම් වරදක් සම්බන්ධ නඩු පැවරීමක දී ඒ අනාවරණය හෝ පිළිතුර ඒ තැනැත්තාට එරෙහිව සාක්ෂියක් ලෙස ආවේශ්‍ය කරගත නොහැකි විය යුතුය.

(3) තම ස්වාමියාගේ උපදෙස් වලට අනුව සත්භාවයෙන් කීකරුව ක්‍රියා කරන ලද හා චෝදකයා විසින් හෝ ඔහු වෙනුවෙන් ඉල්ලා සිටින විටක ස්වාමියා පිළිබඳ සියලු තොරතුරු එළිදරව් කරන ලද සේවකයකු මේ පනත යටතේ නඩු පැවරීමකට හෝ දඬුවමකට යටත් නොවිය යුතුය.

49 සද්භාවයෙන් යුතුව කරන ලද යම් ක්‍රියාවක් සඳහා හෝ මෙම පනතේ යම් විධි විධාන අනුව කරන ලද යම් ක්‍රියාවක් වෙනුවෙන් යම් නිලධාරියෙකුට එරෙහිව නඩු පැවරීමක් හෝ පැමිණිලි කිරීමක් සිදු නොකළ යුතුය.

50 මෙම පනතේ විධි විධාන මගින්

(i) පාරම්පරික දැනුම දරන පුද්ගලයාට තිබෙන හෝ ඔහු භුක්ති විඳින වෙනත් යම් සාධාරණත්ව අයිතින් හෝ සාමාන්‍ය නීතියේ අයිතින් සහ සම්ප්‍රදායන් ප්‍රතික්ෂේප කිරීම හෝ සීමාකිරීම සිදු නොවේ.

(ii) පාරම්පරික දැනුම දරන්නන් අතර පාරම්පරික සහ සාම්ප්‍රදායික ආකාරයෙන් දැනුම වෙත ප්‍රවේශවීම, සම්ප්‍රේෂනය වීම හෝ හුවමාරු කිරීමට බලපෑම් ඇති කරනු නොලැබේ.

(iii) ගෘහස්ත අරමුණු සඳහා පාරම්පරික ඖෂධ භාවිතය, රජයේ රෝහල්වල සහ වාණිජමය නොවන පොදු සෞඛ්‍ය අවශ්‍යතා සඳහා පාරම්පරික ඖෂධ භාවිතය වළක්වනු නොලැබේ.

51 පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා මෙම පනතෙහි වූ විධිවිධාන මගින් අදාල ජීව විද්‍යාත්මක සම්පත් වෙත ප්‍රවේශවීම හෝ ඒවා භාවිතා කිරීම සඳහා අවසර දෙන ලෙස නොසැලකිය යුතුය.

## රැකවරණාත්මක ආරක්ෂාව

52 පාරම්පරික දැනුම මත පදනම්ව නවනිපැයුම් කරන ලද හෝ සංවර්ධනය කරන ලද නිෂ්පාදන හෝ ක්‍රියාවලි සඳහා ලබා ගැනීමට අපේක්ෂිත පේටන්ට් බලපත්‍ර වලට විරුද්ධවීමට හෝ , දැනට ලබා දී ඇති පේටන්ට් බලපත්‍ර වලට එරෙහිවීමට හෝ එසේ නැතිනම් එම පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීමට මැදිහත් වීමේ අරමුණ ඇතිව හෝ පේටන්ට් අයදුම්පත්‍රවල නවතාවය සහ නිර්මාණශීලිත්වය පිළිබඳ පරීක්ෂා කිරීමේදී එය පූර්ව කලාවක් වශයෙන් සැලකිය හැකි විට බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාට සුදුසුයැයි හැගේ නම් පාරම්පරික දැනුම පිළිබඳ දත්ත මූලයේ,ඩිජිටල් පුස්තකාලවල හෝ පාරම්පරික දැනුම පිළිබඳ වෙනත් වාර්තාවල ඇතුලත් කර ඇති දත්ත වෙනත් පේටන්ට් කාර්යාලවලට යැවිය හැකි වේ.

## නියෝග

53 මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ඉටු කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයාට නියෝග සෑදිය හැක.